# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.12 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/713/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. අපරාධයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - මහරගම පොලිස් ස්ථානය.**

2025.04.11 වන දින දහවල් කාලයේ මහරගම පොලිස් වසමේ පොල්වත්ත හන්දිය අසලදී මහරගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් අපරාධ මෙහෙයුම් නිවාරණ රාජකාරි යෙදී සිටියදී සැකකටයුතු අන්දමින් හැසිරුණු පුද්ගලයෙකු ඔහු සතුව තිබූ යතුරුපැදියද සමඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 30 ක් වන ගොඩිගමුව, ගෝනපල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීමේදී, මහරගම පොලිස් වසමේදී රුපියල් 52,000/- ක් සහිත කාන්තාවකගේ මුදල් පසුම්බියක් කොල්ලකෑම, 2025.03.24 වන දින වැල්ලවත්ත පොලිස් වසමේදී කාන්තාවකගේ අත් බෑගය හා ජංගම දුරකථනය කොල්ලකෑම සහ කිරිබත්ගොඩ පොලිස් වසමේ යතුරුපැදියක් කොල්ලකෑම යන සිද්ධීන්වලට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත.

කොල්ලකන ලද දේපල වලින් ජංගම දුරකථනය හා යතුරුපැදිය පොලිස් භාරයට ගෙන ඇත. මහරගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.04.11 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ නවගම්පුර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 08 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 41 ක් වන ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. කේරළ ගංජා සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමශර්න කොට්ඨාසය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.04.11 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ මාලිගාව පාර හන්දියේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ

නිලධාරීන් හා පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් කණ්ඩායමක් ඒකාබද්ධව වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ 06 ග්‍රෑම් 770 ක් කාර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** කාර් රථයද සමඟින් අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මහබාගේ පොලිස් ස්ථානය.

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.04.11 වන දින සවස් කාලයේ මහබාගේ පොලිස් වසමේ වැලිසරමුල්ල වඟුරුබිම් ප්‍රදේශයේදී මහබාගේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 168 මිලි ලීටර් 750 ක් සහ නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1776 (බැරල් 10) ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 30 සහ 53 වයස්වල පසු වන කඳාන සහ ජාඇල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මහබාගේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - හබරණ පොලිස් වසම.

2025.04.11 වන දින දහවල් කාලයේ හබරණ පොලිස් වසමේ හබරණ ත්‍රිකුණාමලය මාර්ගයේ හබරණ ප්‍රදේශයේදී ත්‍රිකුණාමලය දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ මගී ප්‍රවාහන බස් රථයක ඉදිරිපස දොරෙන් පුද්ගලයෙකු ඉවතට විසි වී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පුද්ගලයා හබරණ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ බෝධිවෙල, රිකිල්ලගස්කඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ මගී ප්‍රවාහන බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - නවගත්තේගම පොලිස් වසම.

2025.04.11 වන දින සවස් කාලයේ නවගත්තේගම පොලිස් වසමේ නවගත්තේගම කරුවලගස්වැව මාර්ගයේ අතුරුපොලයාගම ප්‍රදේශයේදී නවගත්තේගම දෙස සිට කරුවලගස්වැව දෙසට ධාවනය වූ ඉරන දැව (ලෑලි) පටවාගත් ටිපර් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි පාපැදිකරුවෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු නවගත්තේගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ අතුරුපොලයාගම, නවගත්තේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නවගත්තේගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු ටිපර් රථ රියදුරු නොනවත්වා ධාවනය කර ටිපර් රථය හා ඉරන ලද දැව තොගය දමා පලා ගොස් ඇත. ටිපර් රථය හා ඉරන ලද දැව තොගය පොලිස් බාරයට ගෙන ඇති අතර ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා නවගත්තේගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - වාරියපොල පොලිස් වසම.

2025.04.11 වන දින සවස් කාලයේ වාරියපොල පොලිස් වසමේ කුරුණෑගල පුත්තලම මාගර්යේ ලක්මල් උයන ප්‍රදේශයේදී කුරුණෑගල දෙස සිට වාරියපොල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු සහ පසුපැදිකරු වාරියපොල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුවන් වයස අවුරුදු 21 වයසේ පසු වූ විජිතපුර හා නාගොල්ලාගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර වාරියපොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ පුද්ගලික බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වාරියපොල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**